# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජූලි 2019

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

---

(AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය ප්‍රශ්න පත්‍රය ස්ව-අධ්‍යයන පොත මත පදනම් වූ අනිවාර්ය ප්‍රශ්න නවයකින් යුක්ත විය. ප්‍රශ්න පත්‍රය කොටස් තුනකි; **A කොටස** ලකුණු 5 බැගින් වූ ප්‍රශ්න 4 කින්ද, **B කොටස** ලකුණු 10 බැගින් වූ ප්‍රශ්න 3 කින්ද, **C කොටස** ලකුණු 25 බැගින් වූ ප්‍රශ්න 2 කින්ද වශයෙනි.

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම ස්ව-අධ්‍යයන පොතේ න්‍යාය සහ යෙදුම් මත පදනම් විය. අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පොත අධ්‍යයනය කර තිබුනේනම් සහ ඉකුත් වර්ෂ 5 ට අදාල පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වී තිබුණේනම් ඔවුන්ට ලෙහෙසියෙන්ම මෙම ප්‍රශ්න පත්‍රය සමත්වීමට අවශ්‍ය ලකුණු 50 ට වඩා ලබාගත හැකිව තිබුණි. පරීක්ෂකවරුන්ට පෙනී ගියේ අයදුම්කරුවන් බොහොමයකට විෂය දැනුම තිබුණ නමුත්, විෂය කරුණු මත පදනම්ව උත්තර විධිමත්ව සකස්කර ගැනීමේ පරිචය ඔවුන්ට නොතිබූ බවයි.

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය. ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කල කාලය මැනැවින් කළමනාකරණය කරගෙන සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලියා ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවෝ සිටියහ. කෙසේවෙතත්, අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් අඩු ලකුණු උපයා තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්න සියල්ලටම වාගේ උත්තර ලියා තිබුණේය. කෙසේවෙතත්, තවත් සමහර අයදුම්කරුවන් ඇතැම් කොටස්වලට උත්තර ලියා තිබුණේ නැත. එසේ වී ඇත්තේ දුර්වල කාල කළමනාකරණය, දැනුම නොමැතිකම, ප්‍රශ්න අවබෝධ කර නොගැනීම නිසා බව පෙනේ.

ඉහත දැක්වූ කරුණු හැර, උත්තර පත්‍ර ඇගයීමේදී දක්නට ලැබුණු පොදු නිරීක්ෂණ පහත පරිදි වේ:

- විශ්ලේෂණ කුසලතා අඩුවීම.
- කියවීමට අපහසු අත් අකුරු.
- වැඩි ලකුණු වෙන්කළ ප්‍රශ්න සඳහා කෙටි උත්තර සැපයීම.
- අඩු ලකුණු වෙන්කළ ප්‍රශ්නවලට දීර්ඝ උත්තර ලිවීම.
- විෂය අධ්‍යයනයේ ප්‍රශ්න හඳුනාගෙන තිබූ නමුත්, ප්‍රශ්නයට අනුරූප වෙමින් උත්තර ලියා නොතිබීම.
- උත්තර සැලසුම් නොකිරීම සහ අදාල නොවන දේවල් වලින් උත්තර ලියා නිම කිරීම.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති **"කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව"** පිළිබඳ උපදෙස් පිළිනොපැදීම.
- ප්‍රශ්නයෙන් විභාග පරීක්ෂක අපේක්ෂා කළ දෑ අවබෝධ කර නොගැනීම.

# <u>A - කොටස</u>

## ප්‍රශ්න අංක 01

විදුලි උපකරණ අයිතම ආනයනය සහ සිල්ලර වෙළඳාමෙහි නිරත ව්‍යාපාරයක් කෙරෙහි බලපාන බාහිර පාරිසරික (ආර්ථික සහ නෛතික) සාධක පිළිබඳව ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ.

මෙය සෘජු ප්‍රශ්නයක් වූ අතර, විෂය කරුණ කෙලින්ම ස්ව-අධ්‍යයන පාඨමාලා පොතෙන් ගෙන ඇත. දී ඇති සාධක පාරිසරික සාධක අදාල කරගෙන උත්තර ලියන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා ඇත. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් අපේක්ෂා කළ දේ වටහාගෙන ඒ අනුව උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. කෙසේවෙතත්, එපරිද්දෙන් ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් විදුලි උපකරණ අයිතම පිළිබඳ ව්‍යාපාරයට අදාල කර නොගෙන පොදුවේ උත්තර ලියා තිබුණි. තවද, ඇතැම් අයදුම්කරුවන් වර්තමාන දේශපාලනික සහ සමාජීය වශයෙන් වන බලපෑම ව්‍යාපාරයට බලපාන බාහිර පාරිසරික සාධක ලෙස සම්බන්ධ කිරීමට උත්සාහ කර තිබුණි. මෙය අයදුම්කරුවන්ට ප්‍රායෝගික යෙදවීම පිළිබඳ දැනුම නොමැති බවට පැහැදිලි සාක්ෂියකි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** අවදානම බාර ගැනීම, අවදානම් තුනී කිරීම සඳහා පිළිගතහැකි ක්‍රමයක් ලෙස සළකනු ලබන අවස්ථාවක් සඳහන් කිරීම අවශ්‍ය විය. **(b) කොටසින්** අවස්ථා 3 ක් දක්වා එක් එක් තත්ත්වයේදී අවදානම තුනී කිරීම සඳහා භාවිත කරන ක්‍රමය හඳුනා දැක්වීම කළ යුතු විය.

කොටස් දෙකටම සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හැකිවූ අයදුම්කරුවන් කීපදෙනෙක් සිටියහ. කෙසේවෙතත්, **(b) කොටස** සඳහා කාර්යසාධනය ඉතාමත් දුර්වල මට්ටමක තිබුණේ අයදුම්කරුවන්ගෙන් බහුතරය අවදානම මග හැරීම සහ අවදානම බෙදාහදා ගැනීම පටලවාගෙන තිබූ බැවිනි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 03

ප්‍රශ්නයේ **(a) කොටසින්** විගණක විසින් අවබෝධයක් ලබාගත යුතු අස්තිත්වය හා එහි පරිසරය සම්බන්ධ අංශ පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් **(a) කොටසට** උත්තර ලියා තිබුණේය. අයදුම්කරුවන් බොහොමයක් ක්ෂේත්‍ර 3 හඳුනා දක්වනවා වෙනුවට දීර්ඝ උත්තර ලියා තිබූ බව සටහන් විය. සමහර විට, මෙම අයදුම්කරුවන්ට දුර්වල කාල කළමනාකරණය නිසා සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවිය නොහැකිවූවා විය හැකිය.

ප්‍රශ්නයේ **(b) කොටසින්** අස්තිත්වයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සංරචක දෙකක් ලැයිස්තුගත කිරීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන්ට සතුටුදායක ලකුණු ලබාගැනීමට හැකිවිය. කෙසේවෙතත්, දේශපාලනික, ආර්ථික, සමාජ පාරිසරික ආදී අදාල නොවන උත්තරද ලියා තිබෙනු දක්නා ලදී.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

ප්‍රශ්නයේ **(a) කොටසින්** තත්ත්වපාලන පද්ධතියක මූලිකාංග පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇති අතර, දී ඇති සිද්ධිදාමයේ හොඳින් කළමනාකරණය නොකෙරෙන මූලිකාංග 3 ක් හඳුනා දැක්වීම අවශ්‍ය කර ඇත. අයදුම්කරුවන් කීපදෙනෙකුට පමණක් අවශ්‍යතාවය හඳුනාගෙන නිවැරදිව උත්තර සැපයීමට හැකි වී ඇත

ප්‍රශ්නයේ **(b) කොටසින්** කළමනාකාර හවුල්කරු ඔහුගේ කණ්ඩායම සමඟ වගකීම් ඉටුකිරීමේදී, ඔහුගේ වගකීම පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කොට ඇත. සමහර අයදුම්කරුවන් මානව සම්පත් කරුණ සහ මෙහෙයුම් කරුණු වැනි පොදු කාරණා ලියා තිබුණි.

තත්ත්වපාලන මූලිකාංගය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම සහ පරිචයේ නියැලී සිටින ආයතනයකට එහි ඇති වැදගත්කමේ අවශ්‍යතාවය ගැන අති දැනුම ඉතාමත් පහළ මට්ටමක බව සඳහන් කළ යුතු වේ. ප්‍රායෝගික අත්දැකීම් නොමැති වීමත් ස්ව-අධ්‍යයන පාඨමාලා පොත පරිශීලනය නොකිරීමත් අඩු ලකුණු ලබා ගැනීමට හේතුවුවා විය හැක.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## B - කොටස

### ප්‍රශ්න අංක 05

ප්‍රශ්නයේ **(a) කොටසින්** දී ඇති සිද්ධිදාමය යටතේ සාකච්ඡා කෙරෙන පැවරුමේ විෂය කරුණ සමග තුන්පාර්ශව සම්බන්ධතාවය ප්‍රායෝගික ලෙස යෙදවීම පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කොට තිබේ.

අයදුම්කරුවන්ගෙන් බහුතරයට පැවරුමේ විෂය කරුණ හඳුනා ගැනීමට හැකිවී තිබුණ නමුත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පැවරුමේ අදහස්කළ පරිශීලක සමාගමේ සමාගමේ කොටස්හිමියන්ට හෝ අධ්‍යක්ෂකවරුන්ට බව සඳහන් කර තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බහුතරයකට අනෙකුත් පාර්ශව දෙකේ කාර්යභාරයන් හඳුනා ගැනීමට හැකිවී ඇත. තවද, අයදුම්කරුවන් බොහොමයකට සම්පූර්ණ උත්තරයක් සැපයීමට නොහැකි වී ඇත. උදාහරණ වශයෙන් සමහර අයදුම්කරුවන්, පාර්ශවයන් පමණක් හඳුනාගත් අතර, තවත් සමහරුන් පාර්ශවයන්ගේ නම් පමණක් සපයා තිබුණි. එමනිසා ඔවුන්ට සම්පූර්ණ උත්තරය සැපයීමට නොහැකි විය.

ප්‍රශ්නයේ **(b) කොටසින්** පරීක්ෂා කර තිබුණේ **කමල් අසෝසියේට්ස්** විසින් පැවරුම බාර ගැනීමට පෙර ඉටුකළ යුතුව තිබූ අවශ්‍යතා හඳුනාගැනීමය. සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකිවූ අයදුම්කරුවන් සිටියහ. සමහර අයදුම්කරුවන්, මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය, මූල්‍ය ප්‍රකාශන සත්‍යාපනය කිරීමට විගණකට ඉඩදීම, වංචා, අවප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවල වැරදි අනාවරණය කර ගැනීම සඳහා විගණකගේ සහයෝගය ලබාගැනීමට එකඟ වීම, වැනි අදාළ නොවන උත්තර ලියා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයේ **(A) (a) කොටසින්** සෘජු ප්‍රශ්නයක් වන බද්ධ ප්‍රවේශය යන්නෙන් කුමක් අදහස් කරන්නේදැයි පරීක්ෂා කර තිබුණේය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණක් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට ඉවහල්වන සතුටුදායක උත්තර සපයා තිබුණේය. ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අනුව අභ්‍යන්තර පාලනයේ ස්ථිරසාර බව, පාලනයන් ඵලදායක විය යුතු බව පාලන පරීක්ෂාවන් ඉටුකළ යුතු බව සහ තහවුරු කිරීමේ විගණන පටිපාටි තිබිය යුතු බව යනුවෙන් කොටස් 3 ක් ඇතුළත් විය යුතුය. එහෙත් අයදුම්කරුවන් බොහොමයක් මේවා අතුරෙන් කරුණු 1 ක් හෝ 2 ක් පමණක් ලියා ඇත. සමහර අයදුම්කරුවන් තහවුරු කිරීමේ පටිපාටිය වැනි තනි වචනයේ අදාළ නොවන උත්තර දී ඇත. සමහරු වර්ෂ දෙකක් සළකා බැලීම බද්ධ විගණන ප්‍රවේශය ලෙස දක්වා තිබූ අතර, සමහරු ඒකාබද්ධ ප්‍රවේශය සඳහා ශබ්ද කෝෂයේ දී ඇති තේරුම පැහැදිලි කිරීමට උත්සහා දරා ඇත.

**(A) (b) කොටසින්** අයභාරය සිදුවීම පරීක්ෂා කිරීමට ඉටුකළ හැකි තහවුරු කිරීමේ විගණන පටිපාටි පිළිබඳව විමසා තිබුණි. අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු සංඛ්‍යාවක් නිවැරදි උත්තරය ලියා තිබුණේය.

ප්‍රශ්නයේ **(B) කොටස** යටතේ "විගණන ලේඛණගතකරණය" සහ වැඩ පත්‍රිකාවක අන්තර්ගතය පරීක්ෂා කර තිබුණේය. ප්‍රශ්න දෙකම න්‍යායාත්මක පාදක ප්‍රශ්න වූ අතර, කෙලින්ම ස්ව-අධ්‍යයන පොතෙන් ලබාගත් ඒවා විය.

**(B) (a) කොටස** යටතේ අයදුම්කරුවන් විසින් විගණන ලේඛණගතකරණය සහ වැඩ පත්‍රිකාවක අන්තර්ගතය නිර්වචනය කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන් සියලුම දෙනා මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. කෙසේවෙතත්, සම්පූර්ණ උත්තරයක් සැපයීමට හැකියාව තිබුණේ කීපදෙනෙකුට පමණි. ඉටුකළ විගණන පටිපාටි වාර්තා කිරීම, අදාල විගණන සාක්ෂි ලබාගැනීම සහ විගණක විසින් එළඹෙන ලද අවසන් නිගමන වැනි කොටස් 3 ක් උත්තරයේ අඩංගු විය යුතු බව ස්ව-අධ්‍යයන පොතේ දැක්වේ. කෙසේවෙතත්, අයදුම්කරුවන් බොහොමයක් ඉහත සඳහන් කරුණුවලින් එකක් හෝ දෙකක් පමණක් දක්වා තිබුණි. තවද, සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයේ දී ඇති "ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි සටහන් කිරීම" වැනි දෑ ලේඛණගතකරණය යනුවෙන් සඳහන් කර තිබුණි.

**(B) (b) කොටසින්,** වැඩ පත්‍රිකාවක ඇතුලත් මූලික තොරතුරු 3 ක් අයදුම්කරුවන් විසින් දැක්වීම අවශ්‍ය කර තිබුණි. කෙසේවෙතත්, සම්පූර්ණ උත්තර සැපයීමට හැකිවී තිබුණේ අයදුම්කරුවන් සුළු දෙනෙකුට පමණි. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය වරදවා වටහාගෙන තිබූ අතර, විගණන සැලැස්මේ අයිතම දක්වා තිබුණි. බොහෝ අයදුම්කරුවන් සේවක නාමය, සේවයට බැඳුණු දිනය, වැටුප, අතිකාල, වැඩකළ පැය ගණන වැනි සේවක වැඩ පත්‍රිකාවල අඩංගු විස්තර ලියා තිබුණේය. සමහර අයදුම්කරුවන් ස්ථිර සහ වර්තන විගණන ගොනුවල ඇතුලත් අයිතම ලබා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්,** විගණක විසින් විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කළ යුත්තේ කුමන අවස්ථාවන්හිදීදැයි පැහැදිලි කිරීම අයදුම්කරුවන් විසින් කළ යුතු විය.

මෙය ඍජු ප්‍රශ්නයක් වූ අතර, කෙලින්ම ස්ව-අධ්‍යයන පොතෙන් ලබාගත් එකකි. අයදුම්කරුවන්ගෙන් බහුතරයට මෙම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකිවිය.

ප්‍රශ්නයේ (b) කොටසින්, විකරණය කළ මත වර්ග පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. පරීක්ෂක අපේක්ෂා කළ උත්තර සැපයීම නිසා බොහොමයක් අයදුම්කරුවන්ට මේ කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හැකිවී තිබේ.

ප්‍රශ්නයේ **(c) කොටසින්** සිද්ධිදාමයේ දී ඇති කරුණු මත පදනම්ව ප්‍රායෝගික ව්‍යාපාර පරිසරය තුළ න්‍යායාත්මක දැනුම යෙදවීමේ අයදුම්කරුවන්ගේ හැකියාව පරීක්ෂා කර ඇත. විගණන මතය කෙරෙහි දක්වා ඇති කරුණුවල බලපෑම තක්සේරු කිරීමේ දැනුම මෙහිලා අදාල වේ. අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික තත්ත්වයට යෙදවීමට හැකිවී නැත.

යෝග්‍ය විකරණ මත වර්ගය තෝරාගැනීම පිළිබඳ දැනුවත්භාවයේ මදකම නිසා අයදුම්කරුවන් බොහෝ දෙනෙකු කිසිසේත් අදාල නොවන උත්තර ලියා තිබූ අතර, විගණන මතයට සම්බන්ධ නොකර සිද්ධිදාමයේ කරුණු සහ සංඛ්‍යා නැවත උත්තරයේ ලියා තිබුණේය. තවද, අයදුම්කරුවන් බොහොමයක් තොග ඇගයීමට අදාල LKAS 02 යටතේ අවශ්‍යතාවයන් විමසා / පැහැදිලි කර නොතිබූ අතර, විකුණුම් පිරිවැය සහ ලාභය කෙරෙහි එහි බලපෑම් සැලකිල්ලට ගෙන නොතිබූ බැව්ද සටහන් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## <u>C - කොටස</u>

### ප්‍රශ්න අංක 08

දෙන ලද සිද්ධිදාමයට සම්බන්ධ ව්‍යාපාරයේ අභ්‍යන්තර විගණන කාර්යය අවබෝධ කර ගැනීමේ හැකියාව සහ අයදුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම යළි මතකයට රැගෙන සත්‍ය ව්‍යාපාරික පරිසරයට ප්‍රායෝගික ලෙස යෙදවීමේ දැනුම පරීක්ෂා කෙරුණු ප්‍රශ්නයකි.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, අනෙකුත් ප්‍රශ්න සමඟ සසඳා බැලීමේදී ඉතා ඉහළ කාර්යසාධන මට්ටමක් ප්‍රදර්ශනය විය.

**<u>(a), (b) සහ (c) කොටස්</u>**

ප්‍රශ්න ඍජු ඒවා වූ බැවින් අයදුම්කරුවන් බහුතරයකට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකිවිය.

**(a) කොටස** සම්බන්ධයෙන්, අයදුම්කරුවන් හට දී තිබූ සිද්ධිදාමයේ සඳහන් පටිපාටිවලට වඩා ක්‍රියාවලීන් පිළිබඳව සිතා බැලීමට තිබුණි. අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ මෙම කොටසට උත්තර ලියා සතුටුදායක ලෙස ලකුණු ලබාගැනීමට හැකිවිය. බිසේවුවත්, පරීක්ෂක අපේක්ෂා කළ ආකාරයට උත්තරට සම්බන්ධ නොවන කළමනාකරණ කුසලතා සහ පුහුණුකිරීමේ ක්‍රියාවලි වැනි අදාල නොවන උත්තර ලියා තිබූ අයදුම්කරුවන්ද සැලකිය යුතු ගණනක් සිටියහ.

ප්‍රශ්නයේ **(b) කොටස** යටතේ දී තිබූ සිද්ධිදාමයේ ඇතුළත්ව තිබූ මුදල් කළමනාකරණ ක්‍රියාවලියේ දුර්වලතා තෝරා ගැනීමට අයදුම්කරුවන්ගෙන් බහුතරයකට හැකිවිය. තවද, බොහෝ අයදුම්කරුවන්ට ප්‍රශ්නයෙන්ම උත්තර ලබා ගැනීමට හැකිවූයේ, දුර්වලතා සියල්ලක්ම පාහේ ප්‍රශ්නයේ දී තිබූ හෙයිනි.

**(c) කොටස** සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. අයදුම්කරුවන්ගෙන් බහුතරයකට මෙම කොටස සඳහා ලකුණු ලබාගැනීමට හැකිවිය.

**(d) කොටස - විශ්ලේෂණ පටිපාටි**

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට උත්තර ලියා තිබුණේ නැත. විශ්ලේෂණ පටිපාටි ලෙස නැවත ගණනය කිරීම, සත්‍යාපනය, වවුචර සවිස්තර ලෙස පරීක්ෂා කිරීම ආදී මුළුමනින්ම අදාල නොවන උත්තර බොහොමයක් අයදුම්කරුවන් විසින් සපයා තිබුණි. විශ්ලේෂණ පටිපාටි යන්නෙන් කුමක් අදහස් කරනු ලබන්නේදැයි අයදුම්කරුවන්ට වටහා ගැනීමට නොහැකිව තිබූ බවක් පෙනුණි.

**(e) කොටස**

යහපත් තත්ත්වයේ පැවතුණ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගෙන ප්‍රශ්නයේ දී තිබූ තීරණය සමඟ අයදුම්කරුවන්ගෙන් බහුතරය එකඟ වී තිබුණි. කෙසේවෙතත්, යහපත් අභ්‍යන්තර පාලනයෙන් සාධාරණ සහතිකවීමක් පමණක් සැපයෙන බව අවබෝධ කරගැනීමට ඔවුන් අපොහොසත් විය. එමෙන්ම මෙහෙයුම් අවදානම් නිරන්තරයෙන් වෙනස් කිරීම, චර්යාගත නොවන ගනුදෙනු කිරීම, මානව දෝෂ ආදිය වැනි යහපත් අභ්‍යන්තර පාලනයන්ට පවා ආවේණික සීමාකරණ බලපෑම් තිබිය හැකිය යන කාරණය ඔවුන් නොසලකා හැර තිබුණි.

එම නිසා මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය ඉතාමත් දුර්වල විය. එසේවුවද, අයදුම්කරුවන් කිපදෙනෙකු තර්කානුකූල උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

**(f) කොටස**

අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයේ මෙම කොටසට උත්තර ලියා තිබුණේය. පද්ධතියේ වැඩසටහන්වලට අනවසර වෙනස්කම් කිරීම වැළැක්වීම හෝ අනාවරණය කර ගැනීමට ස්ථාපිත කළ හැකි පාලනයන් හඳුනා ගැනීමට ඔවුන්ට හැකිවිය. ප්‍රායෝගික ප්‍රශ්නයක් වූ මෙම කොටස සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

### (A) කොටස

#### (a) කොටස

ප්‍රශ්නයේ මෙම කොටසින් දේපළ, පිරියත සහ උපකරණ සඳහා විගණන සාක්ෂි ලබාගැනීම සඳහා කළ යුතු විගණන පටිපාටි පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. සාර්ථක වූ අයදුම්කරුවන් බොහොමයක් ස්ථාවර වත්කම් ලේඛණය සහ ඉඩමේ අයිතිය පිළිපබඳව හිමිකම් ඔප්පු බැලීම ආදිය ගැන සඳහන් කොට මෙම කොටසට අදාල සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. කෙසේවෙතත්, විමර්ෂණය, නිරීක්ෂණය, පරීක්ෂණය, නැවත ගණනය කිරීම වැනි විගණන පටිපාටි වර්ග ගැන සඳහන් කරමින් අදාල නොවන උත්තර ප්‍රශ්නයට සම්බන්ධ කිරීමක් නොකර ලියා තිබූ අයදුම්කරුවන්ද විය.

#### (b) කොටස

ප්‍රත්‍යාගණනය කළ වත්කම් විගණනය කිරීමේදී පිළිපැදිය යුතු විගණන පටිපාටි 3 ක් අයදුම්කරුවන් විසින් සඳහන් කිරීම ප්‍රශ්නයේ මෙම කොටසේ අවශ්‍යතාවය විය. ස්වාධීන තක්සේරුකරුවෙකුගේ වාර්තාව සහ වෙනස් විනිශ්චය කිරීමේ පදනම් පාදක විගණන පටිපාටිවලට වඩා පොදු විගණන පටිපාටි වර්ගවලට යොමුවෙමින් සමහර අයදුම්කරුවන් උත්තර ලියා තිබුණහ.

#### (c) කොටස

ලිඛිත කළමනාකරණ නියෝජනය අවශ්‍ය කෙරෙන වැදගත් කරුණු දෙකක් පැහැදිලි කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. මෙම ප්‍රශ්නය පැහැදිලිවම න්‍යායාත්මක දැනුම මත පදනම් වූ අතර, එම දැනුම තිබූ අයදුම්කරුවන්ට සතුටුදායක මට්ටමක ලකුණු ලබාගැනීමට හැකිවිය.

#### (d) කොටස

ප්‍රත්‍යාගණනය කළ වත්කම් සම්බන්ධයෙන් වෘත්තිය තක්සේරුකරු සමඟ කටයුතු කිරීමේදී සළකා බැලිය යුතු වැදගත් කරුණු 4 ක් පිළිබඳව හඳුනා ගැනීම අවශ්‍ය විය. එහෙත් අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි උත්තර ලියා තිබුණේ නැත.

මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබූ අතර, වත්කම්වල පිරිවැය හෝ අවශේෂ අගය ප්‍රත්‍යාගණනයෙන් පසු ක්ෂය ආදිය වැනි අදාල නොවන උත්තර ලියා තිබුණේය.

### (B) කොටස

අලුත් විගණන පැවරුමක් බාරගැනීමට පෙර අනුගමනය කළ යුතු පටිපාටි පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම කොටසින් පරීක්ෂා කර තිබුණි.

අනුගමනය කළ යුතු පටිපාටි පිළිබඳව විමසීම් නොකොට **සුදත්ට** ලේසියෙන්ම පැවරුම බාරගත හැකි බව අයදුම්කරුවන් බොහොමයක් සඳහන් කර තිබුණි.

### (C) කොටස

ප්‍රශ්නයේ දී ඇති සිද්ධිදාමයට යොමුව ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූලවීම කෙරෙහි බලපාන තර්ජන 3 ක් පැහැදිලි කිරීම අවශ්‍ය කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බොහොමයක් තුනෙන් එකක්, එනම් ස්වයං තර්ජනයක් ඇතිකරන කරුණක් වන විගණනයක යෙදී සිටියදී රැකියාවක් ලබාගැනීමේ කොන්දේසි සාකච්ඡා කිරීම ගැන ලියා තිබුණේය.

පහත දක්වා ඇති අනෙක් තර්ජන 2 අයදුම්කරුවන්ගෙන් බහුතරය හඳුනාදක්වා තිබුණේ නැත:

- සැලකිය යුතු වටිනාකමක් ඇති මාලදිවයිනේ දින 5 ක් නතරවී සිටීමේ වරප්‍රසාදයක් විගණන හවුල්කරුට ප්‍රදානය කර තිබීම.
- විගණන ගාස්තු කපා හැරීමේ තර්ජනයක් එල්ල කරමින් සභාපති විසින් සාවද්‍ය විගණන පරිචයන් බාරගැනීමට පෙළඹවීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් වර්ෂ 5 ක ප්‍රශ්න වලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරික්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍යකරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරික්ෂා කර බලන්න.

- * * * -